# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2064/9 - 2018 මාර්තු මස 26 වැනි සඳුදා - 2018.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**
**57 වන වගන්තිය යටතේ නියෝගය**

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇත්තාවූද මෙහි උපලේඛනයේ විස්තර කර ඇත්තාවූද ඉඩම, අත්කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මගින් අනුමත කරමි.

**රංජිත් සියඹලාපිටිය,**
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.


2018 මාර්තු මස 21 වැනි දින.

උපලේඛනය

ශ්‍රී ලංකාද්වීපයේ බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 576 දරන තුම්බෝව බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්බෝවිල සහ වැවල ග්‍රාමයේ පිහිටි ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද මූලික පිඹුර කො 6242 දරන 1984.12.19 දිනැති සැලැස්මෙහි අංක තුන සහ හතර (3,4) වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණය අක්කර 16 ඉඩම.

*උතුරට* : මූලික පිඹුර නො. 6242 කට්ටි අංක 1 හා 2 දරන ඉඩම සහ දොලේකහටගහවත්ත; *නැගෙනහිරට* : දොලේකහටගහවත්ත හා ජේම්ස් වත්ත ඉඩම; *දකුණට* : ශ්‍රී දේවානන්ද මාවත හා ශ්‍රී දේවානන්ද මාවතේ වරිපනම් අංක 292/1 දරන ඉඩම සහ වරිපනම් අංක 297 දරණ ඉඩම; *බටහිරට* : මූලික පිඹුර නො. 6242 කට්ටි අංක 2 දරන ඉඩම.

1A - G 27360 - 17(2018/03)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.






ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.